**227 - පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුලි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **ආදායම් ලැබීම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| **(අ)** ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විස්තරාත්මක ආදායම් වාර්ථා අනුව මුළු ආදායම හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව එම කාර්යාල විසින් අයකරගත් ආදායම අතර රු.1,543,391 ක වෙනසක් නිරීක්ෂණය විය. | යථෝක්ත ගිණුම්ගත නොවූ මුද්දර ආදායම අවස්ථා දෙකක දී ගලපා තිබිම. | අදාල ගැලපීම් නිවැරදි කිරීම. |
| (ආ) මුදල් පොත අනුව ප්‍රධාන කාර්යාලය විසින් රැස්කරන ලද ගාස්තු රු.130,321,050 ක් වූ අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව එය රු.130,292,150 ක් වූ බැවින් රු.28,900 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා දෙපාර්තමේන්තු පොත් සැසඳීම හා ගැලපීම ඉදිරියේදි අඛණ්ඩව සිදු කිරිමට කටයුතු කරනු ලැබේ. | ආදායම් ගිණුම් තැබීම නිවැරදි කිරීම. |

**1.6.2** **ආදායම් නොවන ලැබීම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| (අ) මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ සඳහන් කර ඇති රු. 23,574,570 ක වෙනත් ලැබීම් වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් වී නොතිබුණි. | ආදායම් ශීර්ෂ අංක 2003-02-03 ට අදාල ආදායම් පමණක් ඒ.සී.ඒ-**1** හි ඇතුලත් කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කිරීම. |
| (ආ) දෙපාර්තමේන්තුවට විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය මඟින් ලැබූ රු.2,663,573 ක ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම ලෙස සටහන් කර තිබුණු අතර මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ එම ආදායම සටහන් කර නොතිබුණි. | එම ව්‍යාපෘතියේ ආදායම සම්බන්ධයෙන් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ගණන්දීමේ නිලධාරියකු ලෙස කටයුතු නොකරයි. | අදාල ගැලපීම් නිවැරදිව සිදු කිරීම. |

## 1.6.3 පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශේෂ පිරික්සුම අනුව බදුකුලී හා පලාත් පාලන ආයතන බදු වටිනාකම රු.14,266,223 ක් වුවද, වියදම් ප්‍රකාශය අනුව එම අගය රු.13,201,776 ක් වූ බැවින් රු.1,064,447 ක වෙනසක් නිරීක්ෂණය විය. | වැය ලෙජරයෙන් වියදම් ප්‍රකාශයට දත්ත ලබා ගැනීමේදි සිදු වූ අතපසුවීමකි. | වියදම් නිවැරදිව ගිණුම් ගත කිරීම. |
| (ආ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන අනුව වියදම් සාරාංශයන්හි අධිහාර වටිනාකම සහ වැය ලෙජරයේ සඳහන් වටිනාකම අතර රු.98,621 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේ දි සැසඳීම් නිවැරදිව කරනු ලැබේ. | දත්ත නිවැරදිව සටහන් කිරීම. |

## 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ කේවල ශේෂ ලේඛන අනුව දෙපාර්තමේන්තුවට අයවිය යුතු මුළු ශේෂ එකතුව රු.129,825,133 ක් වුවද පාලන ගිණුම් අනුව එම අගය රු.129,827,277 ක් වූ බැවින් කේවල ශේෂ හා පාලන ගිණුම් අතර රු. 2,144 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2014, 2015 සහ 2016 වර්ෂ වලදී අත්තිකාරම් බී ගිණුමේ සිදුවී ඇති දෝෂ හේතුවෙන් වෙනස ඇති වී ඇත. 2016 දි රු.7,144 ක් වු ශේෂය දැනට රු.2,144 දක්වා අඩුවී ඇත. | අත්තිකාරම් “බී” ගිණුමේ ශේෂ නිවැරදිව ගිණුම් ගත කිරීම. |

## 1.6.5 තැන්පතු

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව තැන්පතු ලැබීම් වටිනාකම රු.5,614,887 ක් වුවද, මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේදී එම අගය රු.5,612,402 ක් ලෙස සටහන් කර තිබුණි. | දෙපාර්තමේන්තුව සකස් කල පොදු තැන්පත් ගිණුම නිවැරදිය. | වෙනසට හේතු සොයා නිවැරදි කිරිම |

| | | |
|---|---|---|
| (ආ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්හි තැන්පතු සාරාංශය ( **SA 30)** අනුව අංක 6000-00-18-0-30 දරන පොදු තැන්පත් ගිණුමේ සමාලෝචිත වර්ෂයේ තැන්පතු ලැබීම් සහ තැන්පතු ගෙවීම් වටිනාකම් පිළිවලින් රු.670,810 ක් හා රු.844,257 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල හා ACA 4 අකෘතියේ එම අගයන් පිළිවලින් රු.668, 326 ක් හා රු.841,766 ක් ලෙස සටහන්වී තිබුණි. එසේම මෙම වටිනාකම් අක් මුදල් ගැලපුම් ගිණුමේද සටහන් කර නොතිබුණි. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්හි ශේෂ පිරික්සුම **(SA 21)** හා පොදු තැන්පත් ලෙජරය අනුව තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශය (**ACA 4**) සකසා ඇත. | තැන්පතු ලැබීම් හා ගෙවීම් නිවැරදිව සටහන් කිරීම. |

**1.6.6 දේපල පිරියත හා උපකරණ**

------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් හා 2019 දෙසැම්බර් 31දිනට මූල්‍ය නොවන වත්කම්හි වටිනාකම් අතර රු.31,311,460 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේ ආරම්භක ශේෂ නිවැරදි කරගැනීමේ ජ'නල් සටහන් මඟින් මෙම වෙනස සිදු වී ඇත. | අදාල ගැලපීම් නිවැරදිව හෙළිදරව් කිරීම |

**1.6.7 අග්‍රිම ශේෂය**

--------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව වෙනත් දෙපාර්තමේන්තු විසින් මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් දැරූ වියදම රු.580,278,866 ක් වුවද, අක්මුදල් ගැලපුම් ගිණුමේ වෙනත් දෙපාර්තමේන්තු විසින් මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් දරණ ලද වියදම රු.581,343,313 ක් ලෙස ගැලපීම් කර තිබුණි. | දෙපාර්තමේන්තු ලෙජර සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ශේෂ නිවැරදිව සසඳා ගිණුම් පිළියෙල කරමි. | ගනුදෙනු හා දත්ත නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව වෙනත් වැය ශිර්ෂයන් වෙනුවෙන් දරණ ලද වියදම රු.92,630,107ක් වුවද, අක්මුදල් ගැලපුම් ගිණුමේ එය රු.99,714,051ක් ලෙස ගැලපීම් කර තිබුණි. | අක්මුදල් ගැලපුම් ගිණුම නිවැරදිව සකස් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | -එම- |
| (ඇ) | වෙනත් දෙපාර්තමේන්තු වලින් අත්තිකාරම් ගිණුමට ලැබීම් රු.7,031,393 ක් සහ වෙනත් දෙපාර්තමේන්තු වලට අත්තිකාරම් ගිණුමෙන් ගෙවීම් රු.3,384,647 ක් අක්මුදල් ගැලපුම් ගිණුමට ගලපා නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම හා භාණ්ඩාගාර ආදායම් සාරාංශ අනුව වෙනත් දෙපාර්තමේන්තු විසින් එකතු කරන ලද ආදායම රු.193,911,450 ක් වුවද, අක්මුදල් ගැලපුම් ගිණුමේ එම අගය රු.194,169,285 ක් ලෙස ගැලපීම් කර තිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට රු.2,888,420 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණු අතර එය භාණ්ඩාගාරයට ලැබී නොතිබුණු නමුත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මාර්ගස්ථ මුදල් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | භාණ්ඩාගාරයට නොලැබුණු මුදල් මාර්ගස්ථ මුදල් ලෙස පෙන්වීමට කටයුතු කරමි. | මාර්ගස්ථ මුදල් නිසි පරිදි ගිණුම්ගත කිරීම |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට වෙන්කල පුනරාවර්ථන වැය විෂයයන් 03 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් නිරීක්ෂණය විය. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් වියදම් දැරීමේ අවශ්‍යතා පැන නොනැගීම මත ප්‍රතිපාදන ඉතිරි විය. | ඇස්තමේන්තු සංශෝධනය කිරීමට කටයුතු කිරීම. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා මු.රෙ.94(i) ප්‍රකාරව අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා වියදමකට හෝ බැදීමකට නොබැදිය යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවා වැය විෂයන් 4ක රු.2,742,430 ක් බැරකම් වලට එළඹී තිබුණි. | බැරකම් ඇති වූ විෂයයන් පාලනය කිරීමේ හැකියාවක් නොතිබුණු බැවින් සුළු අගයක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් ඇති විය. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට නොබැදීම. |
| (ආ) | 2020 වර්ෂය වෙනුවෙන් 2021 වර්ෂයේදී නිරවුල් කරන ලද එකතුව රු.3,462,815 ක් වටිනා බැරකම්, බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව සිදු කිරීමට සටහන් කර ගෙන ඇත. | බැදීම් හා බැරකම් නිවැරදිව සටහන් කිරීම. |
| (ඇ) | 2021 වර්ෂයේදීවැය විෂයයන් 4 ක බැරකම් නිරවුල් කිරීමට අදාල ගෙවීම් වවුචර් වටිනාකම සහ එම වර්ෂයේ වැය ලෙජරයෙහි සඳහන් කර තිබූ වටිනාකම් අතර රු.162,235 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේ දි බැරකම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යමි. | -එම- |
| (ඈ) | බැරකම් ලේඛනයේ වටිනාකම්, සහ ගෙවීම් වවුචර් අනුව වටිනාකම් අතර රු.5,316,575ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| 2018 අගෝස්තු 21 දිනැති පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2018 හි 04 ඡේදය | ග්‍රාම නිලධාරීන් විසින් හැඳුනුම්පත් සඳහා එකතු කරනු ලැබූ මුදල දින 7ක් හෝ නොවැඩි කාලයකදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාර දී පොදු 172 කුවිතාන්සියක් ලබා ගත යුතු වුවද ඒ සඳහා දින 09 සිට මාස 4 දක්වා කාල පරාසයක් ගත වූ අවස්ථා 141ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5ක නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | මෙම කරුණු සම්බන්ධයෙන් අදාල කාර්යාල දැනුවත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරීම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත විය යුතු සමාලොචිත වර්ෂයට අදාල අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කල ක්‍රියාකාරකම් සැලැස්ම, ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල ඉලක්කයන් සහ ආදායම් දෙපාර්තමේන්තු විසින් වාර්ෂික අයවැය ඇස්තමේන්තු වල සඳහන් එක් එක් ආදායම් ශීර්ෂයන් සඳහා අනුමත ආදායම් ඉලක්කයන් 2020 ක්රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම තුල අදාල තොරතුරු ඇතුලත් කර ඇත. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව සැලසුම් නිවැරදිව සකස් කිරීම. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පරීක්ෂාවේදී සැලසුම්ගත මූලා ප්‍රතිපාදනය මෙන් සියයට 392 ක් දක්වා වැඩිපුර වියදම් කර තිබුණු අවස්ථා මෙන්ම මුලු ප්‍රතිපාදනයම වියදම් කර නොතිබුණු අවස්ථා ද නිරීක්ෂණය විය. | සැලසුම් කල පරිදි අදාල කාර්යයන් ඉටුකිරීමට නොහැකි විය. | නිවැරදි සැලසුම් සකස් කිරීම හා අවශ්‍ය සංශෝධනයන් අනුමත කරගැනීම. |

## 3.2 වෙනත් නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.4,494,476ක සහනාධාර සහ මාරු කිරීම් වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස සටහන් කර තිබුණි. | සහනාධාර මාරුකිරීම් පුද්ගල පඩිනඩි වියදම් වල ඇතුලත් වී ඇත. | ගනුදෙනු හා දත්ත නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශේෂ පිරික්සුම අනුව වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් හී එකතුව රු.92,630,107 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම අගය රු.93,001,775 ක් ලෙස සටහන් වී තිබුණු බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වියදම් රු.371,668 කින් අධිගණනය වි තිබුණි. | E – Nic ව්‍යාපෘතියේ වියදම මෙමගින් දැක්වේ. | -එම- |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ අත්තිකාරම් අයකර ගැනීම් වටිනාකම රු.603,810ක් වුවද,දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව මුදලින් අයකර ගත් අත්තිකාරම් ප්‍රමාණය රු.15,112,282 ක් වූ බැවින් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.14,508,472 ක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | මෙම රු.603,810 මුදල් පදනම යටතේ ගිණුම් ගතකර ඇත. | -එම- |
| (ඈ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ලැබීම් හා තැන්පතු ගෙවීම් වටිනාකම පිළිවලින් රු.592,626ක් හා රු.999,189 ක් ලෙස සටහන් වුවද, දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම සහ ACA 4 ආකෘතිය ප්‍රකාරව වර්ෂය තුල බැර හා හර කිරීම් පිළිවලින් රු.5,612,403 ක් හා රු.9,806,477ක් විය. | තැන්පතු ලැබීම් හා ගෙවීම් මුදලින් සිදු වු ප්‍රමාණය පමණක් සටහන් කර ඇත. | -එම- |

## 3.3 ප්‍රසම්පාදනයන්

------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ----------------------- | | -------------------------- | ----------- |
| (අ) | ප්‍රසම්පාදන සැලැස්මේ වාහන , යන්ත්‍ර හා ගොඩනැගිලි නඩත්තු වියදම් වටිනාකම් පිළිවෙලින් රු.මිලියන 5.76 ක්, රු.මිලියන 40.5 ක් හා රු.මිලියන 0.59 ක් ලෙස එකතුව රු. මිලියන 46.85 ක් වුවද එය රු.මිලියන 95.17ක් ලෙස එම සැලැස්මේ පෙන්නුම් කර තිබුණි. තවද සත්‍ය නඩත්තු වියදම රු.මිලියන 81.72ක් වූ බැවින් සැලැසුම්ගත වියදමට වඩා රු.මිලියන 34.87 ක් එනම් සියයට 74 ක් වැඩියෙන් වියදම් කර තිබුණි. | සේවකයින් ගෙන්වීම සීමා කර තිබුණු බැවින් ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීම මගහැරී ඇත. | ප්‍රසම්පාදන සැලැස්ම නිසි පරිදි සකස් කිරීම හා සංශෝධනය කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 වර්ෂයේ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ඇස්තමේන්තු කර නොතිබුණු එකතුව රු.මිලියන 1.273ක් වූ අයිතම 14 ක ඒකක 72 ක් වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිලදී ගැනීමට සැලසුම් කරන ලද එකතුව රු.මිලියන 4.08ක අයිතම 6ක ඒකක 42ක් 2020 වර්ෂය තුළදී මිලදී ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම අයිතම මිලදී ගෙන ඇත. ප්‍රමාද දෝෂයකින් වාර්තා සංශෝධනය කිරීමට නොහැකි විය. | -එම- |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී මූල්‍ය කල්බදු ක්‍රමයට ලබාගෙන තිබුණු මෝටර් රථයේ කල්බදු කාලය 2019 වර්ෂයේදී අවසන් වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එය දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණි. | 2020 සැප්තැම්බර් සිට මෝටර් රථයේ පවරා ගැනීමේ ලිපි ගනුදෙනු සිදුවෙමින් පවති. | වත්කම් පාලනය කාර්යක්ෂම කිරීම. |

**3.5 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාම නිලධාරීන් විසින් හැඳුනුම්පත් සඳහා අයකරනු ලබන මුදල් හා එම මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවීම් පිළිබඳ සාරාංශ වාර්තාවක් ඊළඟ මාසයේ 05 දිනට පෙර හැඳුනුම්පත් අංශයට ලබා දිය යුතු වුවද කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී වසම් 67 ක එම වාර්තා නියමිත පරිදි ලබා නොදුන් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය. | මෙම අවශ්‍යතාවය පිළිබඳ අදාල ප්‍රාදේශිය කාර්යාලයන් හි නිලධාරීන්ව දැනුවත් කර ඇත. | අභ්‍යන්තර පාලනය කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වා ගැනීම. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් පිරිවැය රු.මිලියන7.5 ක් හා රු.මිලියන9.39ක් වූ වාහන 2ක් මිලදීගෙන පිලිවෙලින් වසර 8ක් හා 6ක් ගතවී තිබුණද 2020 වර්ෂයේදී ද පිරිවය මත රක්ෂණය කිරීම නිසා ඒවායේ රක්ෂණ වියදම සමාලෝචිත වර්ෂයේදී රු.191,535 ක් දක්වා වැඩිවී තිබුණි. | 2021 වර්ෂයේ දි සියලුම වාහන තක්සේරු කර රක්ෂණය කිරීමට කටයුතු කර ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) **(i)** | 2019 ඔක්තෝබර් සිට 2020 මාර්තු දක්වා සිදුකල පෙර මුද්‍රිත කාඩ්පත් මිලියනයක් නැවත ඇනවුම් කර මිලදී ගැනීමේ ගනුදෙනුව නිවැරදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල වී නොතිබුණු බැවින් 2020 සැප්තැම්බර් 10 දිනැති අංක 02/IS/2020 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව දෙපාර්තමේන්තුවට සිදු වූ පාඩුව රු.මිලියන 94 ක් විය. තවද මෙම කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන56.49ක් බැරකම් ලෙස රඳවා ගෙන තිබුණද එම ගනුදෙනුව නිරවුල් කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | පෙරමුද්‍රිත කාඩ්පත් නොමැතිව සිටි අසීරු අවස්ථාවක කඩිනමින් කාඩ්පත් ලක්ෂ 10 ක් මිලදී ගැනීම සිදු වී ඇත. දැනට සියල්ල කිසිදු දෝෂයකින් තොරව භාවිතා කර ඇත. 2020 සැප්තැම්බර් 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික නොවන බව නිරීක්ෂණය වේ. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද පසු හිඟ මුදල් ගෙවීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව, කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කිරීම. |
| **(ii)** | දෙපාර්තමේන්තුව විසින් 2020 ජනවාරි, පෙබරවාරි, ජූලි, අගෝස්තු හා සැප්තැම්බර් යන මාස වල මුද්‍රණය කරන ලද හැඳුනුම්පත් 92,780 ක් අතරින් හැඳුනුම්පත් 5,095 ක් එනම් සියයට 5ක් දෝෂ සහිතව පැවතුණි. | තාක්ෂණික ගැටළු හා දත්ත පද්ධතියේ ඇතිවන ගැටළු හේතුවෙන් දෝෂ ඇතිවේ. දෝෂ අවම කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකර ඇත. | හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමස්ථ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම. |
| (ඈ) | වසර 1 සිට වසර 16 දක්වා කාලයක සිට දෙපාර්තමේන්තු සේවයේ නොමැති මියගිය, වැඩ තහනම් කල හා සේවය අතහැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.269,101ක ණය මුදලක් නිරවුල් කර ගැනීමට දෙපාර්තමේන්තුවට මේ දක්වා නොහැකි වී තිබුණි. | මියගිය නිලධාරියාගේ ණය ශේෂය අයකර ගැනීමටත් අනෙකුත් ණය ශේෂ කපාහැරීමටත් කටයුතු කරමින් පවති. | ණය ශේෂ නිරවුල් කරගැනීමේ ක්‍රමවේදය විධිමත් කිරීම. |

**4. යහපාලනය**

---------------

**4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

-----------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ------------------------------ | ----------- |
| සාමාන්‍ය සේවය යටතේ හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලියේ මූලික අදියරයන් වන ග්‍රාම නිලධාරී විසින් අයදුම්පත්‍රය භාර ගැනීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත භාර දීම හා අදාල අනුමැතීන් සහිතව ප්‍රධාන කාර්යාලයට යොමු කිරීම යනාදිය වෙනුවෙන් මාස 01 සිට වර්ෂ 01 දක්වා කාලයක් ගතකිරීම තුලින් මහජනතාවට | අඩුපාඩු නිවැරදි කිරීමට විශේෂ අවධාන යොමු කර අවශ්‍ය පියවර ගෙන ඇත. | හැඳුනුම්පත් නිකුත් කිරීමේ සමස්ථ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම. |

කාර්යක්ෂම සේවයක් ලබා දීමට නොහැකි වී තිබුණු අවස්ථා 166 ක් දිස්ත්‍රික් කාර්යාල 5ක නියැදි විගණනයේදී නිරීක්ෂණය විය.

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 1384ක් ද තත්‍ය කාර්ය මණ්ඩලය 1271ක් ද සහ පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිලිවෙලින් 123ක් හා 10ක් ද විය. | අනුමත, තත්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩල තොරතුරු නිවැරදි වේ. | කාර්යමණ්ඩල පරිපාලනය විධිමත් කිරීම. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්, නීති නිලධාරී හා භාෂා පරිවර්තක තනතුරු එක බැගින් පුරප්පාඩුවී පැවති අතර 2020 හා 2021 වර්ෂයන් හි ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයට ලිඛිතව දන්වා තිබුණු නමුත් මේ දක්වා බඳවාගෙන නොතිබුණි. | නීති නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර භාෂා පරිවර්තක පුරප්පාඩුව පිරවීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපි මඟින් දන්වා ඇත. | -එම-. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සංවර්ධන නිලධාරී තනතුරු 31 ක් හා කලමනාකරණ සේවා නිලධාරී තනතුරු 44ක් පුරප්පාඩුව පැවතියද 2018 වර්ෂයෙන් පසුව එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගෙන නොතිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුමැතිය ලැබී ඇත.ඉදිරියේදී බඳවා ගැනිමට කටයුතු කරණු ලැබේ. | -එම- |